(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 99.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව 2016 ජූනි මස 29 දිනැති අංක 1973/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6(1) වැනි වගන්තිය යටතේ 2016.08.10 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම-2016 පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**2. පෙත්සම් :**

(1) ගල්කිස්ස, ශාන්ත මේරි මාවත, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි රෂීඩ් කපූර් මහතාගෙන් ලැබුණු 2016.03.22 දිනැති පෙත්සම ගරු රවීන්ද්‍ර සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මඩකලපුව, ත්‍රිකුණාමලය පාර, අංක 525/8 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සලෙස්තින් රූබන් මහතාගෙන් ලැබුණු 2016.06.27 දිනැති පෙත්සම; සහ

(ii) කාතන්කුඩි, කප්රූආඩි පාර යන ලිපිනයෙහි පදිංචි එම්. සී. ඒ. රෂීඩ් මහතාගෙන් ලැබුණු 2016.07.01 දිනැති පෙත්සම

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මීගමුව, 3 කුරණ, මංගල පාර, අංක 30 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඊ. ජේ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2016.04.01 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(4) (i) රාගම, තේවත්ත පාර, අංක 629/167 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ජී. ගුණදාස මහතාගෙන් ලැබුණු 2016.06.27 දිනැති පෙත්සම; සහ

(ii) ගෝනවල (බ.ප.), සපුගස්කන්ද පාර, අංක 612 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඒ. ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2016.07.31 දිනැති පෙත්සම

ගරු ඩුලිප් විජේසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) පානදුර, මහවිල, ආදර්ශ මාවත, නො. 127 සී දරන ස්ථානයෙහි පදිංචි ඩී. ආර්. දයාවංශ පෙරේරා මහතාගෙන් ලැබුණු 2016.04.30 දිනැති පෙත්සම;

(ii) දොඩන්ගොඩ, ගල්කැටමුල්ල, පහන්වත්ත II, අංක 238/24 දරන ස්ථානයෙහි පදිංචි ජේ. මුණසිංහ මහතාගෙන් ලැබුණු 2016.07.15 දිනැති පෙත්සම;

(iii) මතුගම, යටදොලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. කේ. යසවර්ධන මහතාගෙන් ලැබුණු 2016.05.11 දිනැති පෙත්සම;

(iv) මතුගම, යටදොලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. කේ. යසවර්ධන මහතාගෙන් ලැබුණු 2016.05.11 දිනැති පෙත්සම; සහ

(v) මොරටුව, එගොඩ උයන, මෝදර පාර, අංක 282/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. එස්. ඊබ්‍රාහිම් මහතාගෙන් ලැබුණු 2016.06.20 දිනැති පෙත්සම

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(6) කිතුල්ගල, තැලිගම, තුංකිඳ, ගනේපල්ල පාර, අංක 27 දරන ස්ථානයෙහි පදිංචි බී. වී. සී. පී. සමරසිංහ මහතාගෙන් ලැබුණු 2016.08.05 දිනැති පෙත්සම ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(7) පොතුවිල් - පී/19, පසරිච්චෙනායි, අතිහාරි පාර යන ලිපිනයෙහි පදිංචි පී. සබුරා උම්මා මහත්මියගෙන් ලැබුණු 2016.08.09 දිනැති පෙත්සම ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) වංචාවල, කළහෙ, ශ්‍රී ගුණරතන මාවත, පතිනාවත්ත යන ලිපිනයෙහි පදිංචි චන්ද්‍රසිරි රණධීර මහතාගෙන් ලැබුණු 2016.08.10 දිනැති පෙත්සම; සහ

(ii) නාවලපිටිය, ගම්පොල පාර, අංක 138 දරන ස්ථානයෙහි පදිංචි ඩී. කේ. අළුත්ගේ මහත්මියගෙන් ලැබුණු 2016.07.16 දිනැති පෙත්සම

ගරු බිමල් රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(9) මහියංගණ, බ/ මහියංගණ ජාතික පාසලේ සේවය කරන සුදන්ත රත්නායක මහතාගෙන් ලැබුණු 2016.05.06 දිනැති පෙත්සම ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(10) මොණරාගල, වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරන ආර්. එම්. එම්. දිනුස අසංක චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2016.06.16 දිනැති පෙත්සම ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(11) බණ්ඩාරගම, අටුළුගම, අඹගහවත්ත, අංක 52/ඩී දරන ස්ථානයෙහි පදිංචි අබ්දුල් රසිදු ෆාසිමා රාලි මහත්මියගෙන් ලැබුණු 2016.08.05 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. වෛද්‍ය (සංශෝධන) :** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයිද නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 156 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පු. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 4.00 දක්වා ද විය යුතුය. අ. භා. 4.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පැරිස් ගිවිසුම අපරානුමත කිරීම :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1992 මැයි 09 වැනි දින නිව්යෝර්ක්හි දී පිළිගන්නා ලද දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සඳහා වූ පැරිස් ගිවිසුම අපරානුමත කිරීම සම්බන්ධයෙන් 2016.09.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතුය.

(අ. භා. 12.15 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

''ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය''යි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.16 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය''යි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.47 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 3.45 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම :** එකල්හි වේලාව අ. භා. 4.00 පසුකර තිබුයෙන්, අ. භා. 4.04ට නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව 2016 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් කල් ගියේය.